
සන්නස
SANNASA



## දමයන්තිගේ මතකසටහන්




# අපි පරිසරයට ආදරය කරමු.

වර්තමානයේ බොහෝ ජනාකීර්ණ වූ දෙහිවල අත්තිඩිය පුරවරය මැදිකොට ලස්සණ වෙල්යායවල් මැදසුන්දර පුංචි ගමක උපතලද මම බහ තෝරන කලසිටම දුටුවේ පරිසරයේ ස්වාභාවික චමත්කාරය. අහන්න ලැබුනේ වෙල්යාය මැද පිහිටා තිබුන වැව ඉස්මත්තේ රංචු ගැසී සැරිසරණ කුරැල්ලන්ගේ ගීතවත් හඬ. අවට පරිසරය තවත් සුන්දර කරමින් වැවේ පිපී තිබුන ඕලු නෙලුම්මල් ස්වභාවධර්මය ගැන ඇති කලේ චමත්කාරජනක හැඟීමක්. නුදුරින් පිහිටා තිබුන ගමේ පන්සලේ සෑම දිනකම හවසටඇහෙන ඝාන්ඨාර නාදයත් පිංකම් කාලවල නිතරම අහන්න ලැබුන තුන් සරණෝකවි ගායනයන් සිතට දැනුනේ භක්තියක්.

පිටරටක ජීවත් වුවත් මෙවැනි පරිසරයක හැදී වැඩී රටට ස්වාභාවික පරිසරයට ආදරය කරන මට වර්තමාණයේ අහන දේවල් නිසාදැනෙන වේදනාව අපමණයි. විදෙස්ගතවසිටියත් මා මෙන්මබොහහෝ පිරිස් මව්බිමට ආදරෙයි. ඈත අතිතයේ අපේ මුතුන්මිත්තන් මෙන්ම ඔවුන්ගෙන් බිහිවුන පරපුර ගස්කොලන් වලටවන සතුන්ට පමණක් නෙවේ මනුස්සකමටත් බොහෝ සේ ගරැ කලා. ඔවුන් ඉහලට ඉගෙන ගත් බුද්ධිමත් පරපුරක් නොවූවත් පරිසරය හා බැදුනු දැනුමෙනුත් ජීවනඅත්දැකීම් තුලිනුත් මනා පෝෂණයක්ලද තීක්ෂණ ඥදනයක් ලත් පිරිසක්. ඒ නිසා තමන්ට උරැම වූ ස්වාභාවික සම්පත් රැක ගැනීමට වෙහෙසුනා. තම රටේ දේ සුරක්න පෙලඹුනා. ඒවාට බොහෝ සේ ආදරය කලා. අපේ රට යටත් විජිතයක්ව පැවති සමයේත් රට බේරා ගැනීමට පෙරමුණගත්තෙත් මේ අතරින් බිහි වූ පිරිස්මයි. ඊට පසු බිහි වූ පරපුරවල් විවෘත ආර්ථිකයත් සමග නව චින්තනයන් තුලින් වෙනමමමනසකින් සමාජය දකින්න ගත් උත්සාහය නිසා ඒ පසුපස වටිනා සම්පත් වගේම පොතපතට ආදරය කරන පිරිස් වෙනස්ම සිතිවිලි රාමුවකටකොටුවීමේ විපාක අත්දකින්න ලැබුනා. එහි විපාක ලෙස වර්තමානයේ අපට ස්වාභාවිකව ලැබුන අපේ උරැමයන් අහිමි වන තත්වයක් තුල අතරමන්ව සිටින තත්වයකටපත්වී ඇත්තේ තමන්ගේ දේ රැකගන්නවාට වඩා මුදල් පසුපස දුවන එකිනෙකා පරයමින් ඉහලට යන තත්වයට පත් වීමෙන් ආත්මාර්ථය මුල් කරගත් පිරිසක් බිහිවීමෙන්. මේ නිසා අද වනවිට රටේ ඉහල නිලධාරින් තමන්ගේ පෞද්ගලික අරමුණු මුල්කරගන රටේ සම්පත් විනාස කිරීමට තැත්කරනවා.

වනාන්තර එලි කරනවා සමහරැ හොරෙන් ගස් කපනවා. මේවාගේ අරමුණවන්නේ පෞද්ගලික වාසි ලබා ගැනීම. මේකට හේතුවක් වන්නේ උගතුන් බිහිවන්නේ පොතේ දැනුමන් පමණක් වීම හානිදහස් මනසකින් අනාගතය දෙස බැලීමට විශේෂයෙන්ම තම රටේ දේ අගයන්න රැකගන්න කුඩා කල සිටම එහි වටිනාකමතුලින් රටට දැයට ආදරය කිරීමට හුරැවක් ලමා වයසේ සිටම නොලැබීමයි. අනාගතයේ බිහිවන මතු පරපුර රටේ අනාගතයබාර ගන්නේ ආත්මාර්තය මුල්කරගන මිසක රටට වැඩක් කරන චේතනාවෙන් නොවන බව පැහැදිලිවම පෙනෙන කරැණක්. කඩොලාන කපා විනාස කරන්න හදන ඔක්සිජන් ගැන නොදන්න පිරිසක් වෙසෙන රටක අනාගතය කෙබදු තත්වයකට පතවේවිද යන්න ගැටලුකාරී තත්වයක්. අතීතයේ අපේ ගුරැ භවතුන් අප දෙමව්පියන් වැනියි. එකල තම දරැවන් දෙමව්පියන්ට අකීකරැ වූ අවස්ථා වලදීත් යහමගට ගත්තේ ගුරැවරැන්. අදත් එවන් ගුරැවරැන් සිටිනවා. නමුත් ගුරැවරයෙකුට දරැවෙක්ව යහමගට ගන්න පුලුවන්කමක් අද සමාජයට නැත්තේ පසුදාට පොලුඅරගන පාසලට එන පියවරැ නිසා. නැතිනම් ස්ථාන මාරැවකින් දුෂ්කර පලාතකට මාරැ කරන නිසා.

මට මතකයි බොහෝ කලකට පෙර මම කියවපු මා පයට තණ නිල්ල කියන අනර්ඝ කෞතිය. මෙය අදටත් මගේ පුංචි පුස්තකාලයේ සුරැකිව තබාගන රකින පොතක්.

1931 වසරේදී ***GRASS FOR MY FEET*** නමින් මුලින්ම පලවී පසු කලකදී එනම් 1970 වසරේදී නිව්ටන් ජයසේන මහතා විසින් සිංහල භාෂාවෙන් පරිවර්තනය කරන ලද මේ පොතෙන් කියවෙන්නේ

ගාල්ල උෟරල කියන සුන්දර ගමේ 1902 උපත ලද තම රටට විශාල කීර්තියක් ගෙනදුන් ජිනදාස වීරතුංග කියන මෙම මහතාගේ ලමා අවදියයි. ඈත අතීතයේ සොදුරැ මතකයන් අවදි කරමින් ලයාන්විත ආකාරයෙන් සිත් ඇදගන්නා ආකාරයට වචනවලට පෙරලමින් තම ලමා කාලය

ගතකල අන්දම විස්තර කරන මේ කෘතිය එකල සමාජ පසුබිම හා ස්වාභාවික පරිසරය අවට කැලෑවන් හා ගස්කොලන්ගංගා ඇලදොලවල් යස අපූරැවට විස්තර කරනවා. එම කාලවකවානුව තුල දෙමව්පිය දරැවන් අතර මෙන්ම නැදෑ හිත මිතුරන් අසල්වාසීන් අතර එකමුතුකම හා සරල ගතිපැවතුම් විස්තර කරන බොහෝම වටින පොතක් ලෙස මම මේ පොත හා බැදීසිටිනවා. මෙවන්පොත් දරැවන්ට කියවන්න ලැබෙනවානම් එම දරැවාගේ මනසේ ඇදෙන මේ චිත්ත රෑප මනසින් වැඩී වැඩහිටිමිනිසකුගේ තත්වයට එනවිට රටට ආදරය කරන්න වනාන්තර සුරකින්න රටේදේ රැකගන රටට අවංකවම සේවය කරන්නකැපවෙනවා. අවාසනාවකට අද දරැවො කෙසේ වෙතත් වැඩිහිටි පිරිස් වත් මෙවන් පොත් කියවල තිබේ නම් අතීතයේසිදු වූ බොහෝ වැරදි නිවැරදි වී පරිසරයට වන හානිකරදේවල් අවම කර ගුණගරැක පිරිස් බිහිවෙන්න තිබුන. ඊලගට මගේ මතකයටඑන්නේ ලෙටිෂියා බොතේජු මහත්මියගේ මට මතකයි යන නවකතා කෞතිය. එය මට කියවීමට ලැබුනේ බොහෝ කලකට පෙර නවකතා කියවීමට පටන්ගත් අලුතමයි. මෙය මම

කියවන විට මට දැනුන සමීපබව නිසාම මට හිතුනේ මේ මගේම කතාවද කියලයි වෙල්යායවල් අවුරුදු කෙලි-සෙල්ලම්මැදිකරගත් පවුලේ කතාවක් වන මෙහි අන්තර්ගතයට මම අදටත් ඇලුම් කරනවා. කුඩාකල සිටම දරැවන් පාසල් වලට අමතරව දහම් පාසල් කරා යොමුකරනවා නම් දහම් දැනුමෙන් වැඩිහිටියන්ට ගරැකරන පිරිස් සමාජයට බිහිවෙනවා. පරිසරයට සතුන්ට ගහකොල වලට ආදරය කරන පිරිස් සමාජයට බිහි වීමෙන් තම රටට ආදරය කරන මානව දයාවෙන් පොහොසත් මිනිස්පරපුරක් බිහි වෙනවා. සමහර පිරිස් සෙල්ලම් පිට්ටනි හදන්න මිනිස් ජීවය බදු ගස් කපන්නත් පෞද්ගලික හේතු නිසා පරිසරයට හානි කරන සිදුවීම් කිරීමට සැරසෙන්නේ අවසර නොලද තැන

රණ්ඩු කරන්න පෙළඹෙන්නේ එම සම්පත් වලට මිලක් නියම කලනොහැකි තරමට වටින අනර්ඝ වසතූන් බව නොදන්න නිසාදකියන පැනයක් පැන නගින්නේ මේ තරම් මිනිසුන් ආත්මාර්ථකාමී වන්නේ කෙසේද යන කරුණත් සමගයි. අතීතයේදී රට ජාතිය ආගම බේරා ගැනීම උදෙසා හා රටේ සම්පත් රැකගන්න රටට ආදරය කරන නිර්භීත පුරවැසියෝ එක්නායකයකු යටතේ රැස් වී නොබියව පෙරමුනට ආවේ එකමුතුකම නිසයි.

වර්තමානයේ අප මිනිසුන්ගේ එකමුතුකම

නොමැතිකම හා බලලෝබිකම නිසා අප රටේ මිනිසුන් පමණක් නොවේ සතුන් පවාඅසරණ තත්වයට පත් වී සිටිනවා.

